01



# අකීදා



සමාන්‍යයෙන් මිනිස් ජීවිතය විශ්වාසය මත ගොඩනගා ඇත. දෛනික ජීවිතයේ දී මිනිසාව ක්‍රියාත්මක කරවන්නේ ද ඔහු තුළ දක්නට ලැබෙන විශ්වාසය වේ. මුස්ලිම් බැතිමතකු ගේ ජීවිතය ගත් කල, ඔහුගේ ජීවිතය විශ්වාසයේ පදනමින් ගොඩනැගිය යුතු ය. අවසානය තෙක් ඔහු එම විශ්වාසය ම ක්‍රියාත්මක කළ යුතු ය, යන්න ඉස්ලාමයේ අභිප්‍රාය වේ. එහෙයින් අල් කුර්ආනයේ තුනෙන් එක් කොටසකට වඩා වැඩියෙන් විශ්වාසය පිළිබඳ ව සාකච්ඡා කර ඇත. ඊමාන් සමග අමල් සඳහන් වන ස්ථාන 70කට වඩා වැඩි ය.

මා කවරකු ද? මෙලොව මගේ සේවය කුමක් ද? මගේ අවසානය කෙබඳු ද? ආදී ජීවිතයේ මූලික ගැටලුවලට මුස්ලිම් බැතිමතකු ඊමානීය පදනම මත පිළිතුරු සෙවිය යුතු ය. මෙලෙස විශ්වාස සඳහා ඉස්ලාමය තුළ විශාල වැදගත් කමක් ලබා ගෙන ඇත.

අකීදා නැතහොත් අකාඉද් යන පද ''විශ්වාසය'' හුවා දැක්වීමට භාවිත කරනු ලැබේ. ඉස්ලාමීය සම්ප්‍රදය තුළ ''අකීදා'' යන පදය, "අවසාන වූත් ස්ථිර වූත් සාධක තුළින් ගොඩනගන ලද විශ්වාසය" යන්න දැක්වීමට භාවිත කරනු ලැබේ.

අල්ලාහ් විසින් තෝරා ගන්නා ලද දේව ධර්ම දූතයන් සියල්ලන්ම එක ම අකීදාව දේශනා කළ බවට අල් කුර්ආනය සාක්ෂය ය.

"අපි නුඹට ධර්මයෙන් අනුශාසනා කළ දේ තව ද නුඹ වෙත පහළ කළ දේ තව ද ඊසා, මූසා, ඉබ්‍රාහිම්, යනාදී අයට අප අනුශාසනා කළ දේ ඔහු නුඹලා වෙත ද නියම කොට තිබේ. ඒ නුඹලා දීන් (ඉස්ලාමීය ජීවන මාර්ගය) තහවුරු කරනු. ඒ තුළ නුඹලා භේද බින්න නොවනු යන්නයි." (42:13) යන්නෙන් අල් කුර්ආනයේ සඳහන් කරයි.

ඉස්ලාමීය ඉතිහාසය තුළ විවිධ කලාවන් බිහි වූ විට, ඉස්ලාමීය විශ්වාසය ගොනු කර දීමට බිහි වූ එකම කලාව ''ඉල්මුල් අකීදා'' හෙවත් ''ඉල්මුල් අකාඉද් '' නම් කලාව වේ. අල් කුර්ආනය හා අස්සුන්නාහ් වඉල්මුල් අකීදාවට පාදක කර ගෙන ඇත. ඉස්ලාමීය මූලික විශ්වාසයන් පිළිබඳ ව ඒවා සාකච්ඡා කරයි. උදහරණයක් ලෙස පහත සිදුවීම දැක්විය හැකි ය. ජිබ්රීල් (අලෛ) තුමා ''ඊමානය පිළිබඳ ව මට පවසන්න'' යැයි නබි (සල්) තුමාට පැවසූ විට, ''අල්ලාහ්, ඔහුගේ මලක්වරුන්, ඔහුගේ ආගම්, ඔහුගේ දේව ධර්ම දූතයන්, පරමාන්ත දිනය හා යහපත- අයහපත දේව කැමැත්ත අනුව සිදු වේ, යන්න විශ්වාස කිරීම ඊමාන් වේ ''යනුවෙන් පිළිතුරු දුන්හ. (බුහාරි)

**මෙම හදීසය තුළ ප්‍රධාන විශ්වාස හයක් ගෙනහැර දක්වයි.**

01. **අල්ලාහ් පිළිබඳ විශ්වාසය** -

අල්ලාහ් සිටින්නේ ය, ඔහු ඒකයෙකි යන්නට ශාක්ෂයය, ඔහුගේ ගුණාංග, ඔහුගේ අලංකාර නාම, ඔහුගේ හැකියාවන් හා ශක්තිය යනාදිය මෙම අංශයෙහි විස්තර කර ඇත.

02. **මලක්වරුන් පිළිබඳ විශ්වාසය** -

මලක්වරුන්, ජින්වරුන් පිළිබඳ විස්තර මෙම අංශයෙහි අන්තර්ගත වේ. තව ද ''රූහ් '' පිළිබඳ විස්තර ද මෙහි අන්තර්ගත කර ඇත.

03. **ආගම් පිළිබඳ විශ්වාසය** -

මානව සමූහයට මග පෙන්වීම උදෙසා දෙවියන් පහළ කරන ලද සුහුෆ්, ආගම් පිළිබඳ ව මෙහි පහදා දී ඇත.

04. **නබිවරුන්, රසූල්වරුන් පිළිබඳ විශ්වාසය** -

නබිවරුන්ගේ ගුණාංග, ඔවුන්ට ලබා දෙන ලද හාස්කම්, ඔවුන්ගේ සේවාවන් මෙහි පැහැදිලි කර ඇත.

05. **පරමාන්ත දිනය පිළිබඳ විශ්වාසය** -

කබ්රය, බඃස්, හිසාබ්, මීසාන්, සිරාත්, ජන්නා, නාර් පිළිබඳ කරුණු මෙහි අඩංගු කර ඇත.

06. **කලා කදර් පිළිබඳ විශ්වාසය** -

මුළු විශ්වය ම ක්‍රියා කරවන දෙවියන්ගේ අභිප්‍රාය පිළිබඳ ව මෙහි පැහැදිලි කර ඇත.

آمَنْتُ بِاللهِ وَمَلَائِكَتِهِ وَكُتُبِهِ
وَرُسُلِهِ وَالْيَوْمِ الْآخِرِ وَالْقَدْرِ خَيْرِهِ
وَشَرِّهِ مِنَ اللهِ تَعَالَى

මෙම ප්‍රධාන විශ්වාසයන් හය අකීදා කලාවේ ඉස්ලාමීය විද්වතුන් පහත ආකාරයට කොටස් හතරකට බෙදා පැහැදිලි කර තිබේ.

### 01. අල් ඉලාහියියාත් -

අල්ලාහ් පිළිබඳ විශ්වාසය, කලා කද්ර් පිළිබඳ විශ්වාසය, ඒ හා සම්බන්ධ සියලු කරුණු මෙහි අඩංගු වේ.

### 02. අන් නුබුව්වාත් -

නබිවරුන්, රසූල්වරුන් පිළිබඳ විශ්වාසය, ආගම් පිළිබඳ විශ්වාසය යනාදිය සමග සම්බන්ධ වන සියල්ල ම මෙහි අඩංගු වේ.

### 03. අර් රූහානියියාත් -

මෙලොවටත් ඉන්ද්‍රියන්ටත් ගෝචර නොවන මලක්වරුන්, ජින්වරුන්, ෂෛතාන්වරුන්, රූහ් යනාදිය මෙහි අඩංගු වේ.

### 04. අස් සම්ඉයියාත් -

පරලොව ජීවිතය සම්බන්ධ සියලු කරුණු මෙහි අඩංගු වේ. ( කබ්ර්, බඃස්, මහ්ෂර් හිසාබ්, මීසාන්, හව්ල්, සිරාත්, ජන්නා, නාර්,)

විශ්වාසය, යහපත් වන විට ජීවිතය ද යහපත් වේ. ජීවිතයට ශ්‍රේෂ්ඨ අරමුණක් ලබා දී, එය බලවත් කරන අගනා සේවයක් ''ඉස්ලාමීය අකීදා'' ඉටු කරයි. මෙම අකීදාව නොමැති ව මුස්ලිම් තනි පුද්ගලයකු හෝ මුස්ලිම් සමූහයක් ගොඩ නැගිය නොහැකි ය.

මුස්ලිම් සමූහය තුළ පසුකාලීන ව ඇති වූ දේශපාලනික අර්බුද, අන්‍ය චින්තනයන් ගේ බලපෑම්, විචාර බුද්ධියෙහි සීමාව ඉක්මවීම ප්‍රමුඛ විවිධ කාරණා හේතු කොට ගෙන අකීදාවෙහි සෞම්‍යබව ගිලිහී ගියේ ය; අවුල් සහගත විය. මිනිසා ක්‍රියාත්මක කර ජීවිතය බලසම්පන්න කිරීමට උර දෙන ශක්තියක් බවට පත් විය යුතු එය ඊට හාත්පසින් ම පටහැනි ව කෝලාහලවලට හා සටන්වලට මග පෙන්වන කරුණක් බවට පත් විය. කෙටියෙන් පවසනවා නම් "අකීදා" කතා වස්තුවක් බවට පත් විය.

අකීදාවෙහි විවිධ පසුබිමකින් යුක්ත වූවන් අදහස් ප්‍රකාශ කිරීමේ දී මුස්ලිම් සමූහය තුළ වෙනස් වූ පිරිස් රැසක් බිහි විය. ජබරියියා, කදරියියා, මුර්ජිආ, මුඃතසිලා යන පිරිස් ඊට උදාහරණ කිහිපයකි.

ඉස්ලාමීය අකීදාව මෙවැනි වැරදි ක්‍රියාමාර්ග තුළින් බලපෑමට ලක් නොවිය යුතු ය. එහි පිවිතුරුභාවය අහිමි නොවිය යුතු යැයි සිතූ විද්වත්හු රැසක් එය රැක ගැනීමෙහිලා සේවාවන් රැසක් දියත් කළහ. අහ්මද් බින් හන්බල් (රහ්), අබුල් හසන් අල් අෂ්අරී (රහ්), අබූ මන්සූර් අල්මාත්තුරුදී (රහ්), යන ඉමාම්වරු මෙම සේවයට විශාල දයකත්වයක් ලබා දුන්හ. මොවුන් සියල්ලෝ ම "අහ්ලුස් සුන්නාහ් වල් ජමාආ වට" අයත් වූවෝ වෙති. අහ්ලුස්

සුන්නාහ් වල් ජමාආ යනු මුහම්මද් (සල්) තුමාගේ හා සහාබිවරුන්ගේ මග පිළිපදින්නන් වේ. මෙම පිළිවෙත් පිළිපැද ජීවිතය ශක්තිමත් කරමු; මෙලොව, පරලොව සෞභාග්‍යවත් කර ගනිමු.

**අභ්‍යාස**

01. "අකීදා" යන පදයෙහි අර්ථය කුමක් ද?

02. "ඉල්මුල් අකීදා" බිහි වීමට හේතු සඳහන් කරන්න.

03. ඉස්ලාමීය අකීදාවට පදනම් වන මූලාශ්‍රය මොනවා ද?

04. "අකීදා" කාල වෙනස්වීම්වලට අනුව වෙනස් නොවේ, යන්නට සාධක අල් කුර්ආන් වැකියක් මගින් පහදන්න.